# දකුණු පළාත් සභාව

## ප්‍රධාන ලේකම් කාර්යාලය

# ලංසු ආරාධනයයි

# නව වාහන මිලදී ගැනීම

## ලංසු අංකය : SPC/CSS/NCB/15/6/V/03

දකුණු පළාත් ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් දකුණු පළාත් සභාව සඳහා මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ නව වාහන මිලදී ගැනීම සඳහා සුදුසුකම්ලත් නියෝජිත ආයතනවලින් ලංසුපත් කැඳවනු ලැබේ.

| ලංසු අංකය | වාහන විස්තරය | ප්‍රමාණය | ලංසු සුරක්ෂණය | ආපසු නොගෙවන ලංසු මුදල |
|---|---|---|---|---|
| SPC/CSS/NCB/15/6/V/03 | Brand New ඩබල් කැබ් | 67 | රු. 8,500,000.00 | රු. 60,000.00 |
| | Brand New මෝටර් රථ | 13 | | |

02. ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කරමින් ලංසුපත් කැඳවන අතර, මව් සමාගමේ බලයලත් නියෝජිත ආයතවලින් පමණක් ලංසුපත් කැඳවනු ලැබේ. මව් සමාගමේ බලයලත් නියෝජිත ආයතන නොවන ආයතනයන්ගේ ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මේ සඳහා පළාත් සභා අරමුදල භාවිතා කරයි.

04. ආපසු නොගෙවන රු. 60,000.00 ක ගාස්තුවක් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සරප් වෙත ගෙවීමෙන් අනතුරුව 2019.08.02 දින සිට 2019.08.27 වන දින දක්වා 09.00 පැය සිට 15.00 පැය දක්වා රජයේ වැඩ කරන දිනවලදී ගාල්ල, එස්. එච්. දහනායක මාවත පිහිටි ප්‍රධාන ලේම් කාර්යාලයේ, ගණකාධිකාරී (සැපයුම්) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

05. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලත්, වාණිජ බැංකුවකින් 2019.12.31 දින දක්වා වූ වලංගු දකුණු පළාත් ප්‍රධාන ලේකම් නමට ලබාගත් රු. ලක්ෂ 85 ක් වටිනා ලංසු ඇපකරයක් ලංසු පත්‍රිකාව සමග ඉදිරිපත් කළ යුතුය.

06. ලංසු පත්‍රිකා ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතුය. ලංසු පත්‍රිකා බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ **"Bid No : SPC/ CSS/NCB/15/6/V/03- Bids for Brand New Vehicle"** යනුවෙන් සඳහන් කළ යුතුය. මුද්‍රා තබන ලද මිල ගණන් සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්. එච්. දහනායක මාවත, ගාල්ල යන ලිපිනයට 2019.08.28 දින පෙ.ව. 10.30 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. විද්‍යුත් තැපෑලෙන් හා ප්‍රමාද වී ලැබෙන ලංසු පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. ලංසු පත්‍රිකා පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය. එහි මුල් පිටපතෙහි මුල් පිටපත යනුවෙන් සඳහන් කළ යුතු අතර, අනු පිටපතෙහි අනු පිටපත යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසුපත්වල මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක එක් කවරයක බහා එම කවරයද මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය.

08. මේ සඳහා පූර්ව ලංසු රැස්වීම 2019.08.16 දින පෙ.ව. 10.30 ට ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ලේකම් නිල කාමරයේදී පැවැත්වේ. මේ සඳහා උනන්දුවක් දක්වන නියෝජිතයන්ට මෙම පූර්ව ලංසු රැස්වීමට සහභාගී විය හැකිය.

09. ලංසු පත්‍රිකා භාර ගන්නා වේලාව අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලබන අතර, ඒ සඳහා ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගී විය හැකිය.

10. ඉදිරිපත් කරන ලද සියලු ලංසු පත්‍රිකා ප්‍රතික්ෂේප කිරීමේ හා අවලංගු කිරීමේ අයිතිය ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

11. තවද, මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ප්‍රසම්පාදන ලියවිලි පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී (සැපයුම්) වෙතින් ලබාගත හැකිය. (දුරකථන අංක 091-4946368 / 091-4946974/ Fax 091-2226409)

**ආර්. සී. ද සොයිසා**
**ප්‍රධාන ලේකම් - දකුණු පළාත,**
**සභාපති - ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රධාන ලේකම් කාර්යාලය,**
**එස්. එච්. දහනායක මාවත,**
**ගාල්ල.**

2019.07.30